**#mediaethicsSL #EnglishPress #lka #Dailymirror #August30**

කෲරත්වය, ප්‍රචණ්ඩත්වය යනාදී කම්පනය හෝ හිත් වේදනාව ඇති කරනා ආකාරයේ සමාජ ප්‍රශ්න වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප හා චිත්‍ර, අවශ්‍ය සංවේදීතාවයෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන්ම සැලකිලිමත් විය යුත්තේය. මෙසේ ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් නිකුත් කරනු ලැබූ වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ දැක්වෙයි.

ඩේලි මිර(ර්)පුවත්පතේ 'යොවුන් දැරියකගේ සිරුර කුඹුරක තිබියදී හමුවෙයි' යනුවෙන් සිරස්තල යෙදුණු ප්‍රවෘත්තිය සමග, එම සිරුර තිබෙනා අයුරු බොඳ කිරීමකින් තොරව දක්වා තිබුණි. මෙය ඉහත දැක්වූ ආචාර ධර්මය හා නොගැටේද? එසේ නොවන්නේ නම් ඒ මෙම ඡායාරූපය පළ වීම පොදු ජන යහපත උදෙසා අදාළ වන නිසාවෙන්ද? මේ පාඨක ඔබගේ අදහසට අවස්ථාවයි.